ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම

இலங்கை கால நிலை நிதியம் (தனியார்) நிறுவனம்

Sri Lanka Climate Fund (Pvt) Limited

2020

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT



පටුන

01. අධ්‍යක්ෂ මණ්ඩලය 1

02 හැඳින්වීම 2

2.1. දැක්ම 2

2.2. මෙහෙවර 2

2.3. ආයතනික අරමුණු 2

2.4. ශ්‍රී ලංකා දේශගුණ අරමුදලේ දායකත්වය 3

03.ආයතනික ගමන්මඟ 5

04.සේවාවන් 6

4.1 හරිතාගාර වායු සත්‍යාපනය 6

4.1.1 හරිතාගාර වායු සත්‍යාපන අංශයේ වාර්ෂික ප්‍රගතිය -2020 6

4.2 ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය (SLCCS) 7

4.3 පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය (CDM) 7

4.3.1 පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණ වාර්ෂික ප්‍රගතිය 2020 7

4.4 ශුද්ධ ශූන්‍ය (Net Zero Energy) බලශක්ති සහතිකකරණය 8

4.5 දේශගුණික ධනාත්මක සහතිකකරණය (Climate Positive Certification) 8

4.6 උපදේශන සේවාවන් 9

4.7 ව්‍යාපෘති හා මූල්‍ය කළමනාකරණ ව්‍යාපෘති 9

05. අපේක්ෂිත මූල්‍ය ඉලක්ක - 2020 10

06. මූල්‍ය ප්‍රගතිය 11

2020 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්වය ප්‍රකාශය 11

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුල විස්තීර්ණ අදායම් ප්‍රකාශය 13

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය 14

2020 දෙසැම්බර් මස 31 මූල්‍ය ප්‍රකාශන සඳහා සවිස්තරාත්මක සටහන 15

විගණන වාර්තාවන් 18

01. අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපතිගේ සමාලෝචනය



වෛද්‍ය අනිල් ජාසිංහ මහතා - (ලේකම්) සභාපති, පරිසර අමාත්‍යාංශය

පරිසර අමාත්‍යාංශයට අනුබද්ධිත ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම අදාලව සකස් කරන ලද 2020 වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවිඩය නිකුත් කරනු ලබන්නේ ඉතා සතුටිනි ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය සඳහා පරිසරය . ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීමට මෙම ආයතනය මඟින් 2020 වර්ෂයේ පියවර රාශියක් ක්‍රියාවට නංවා ඇත මේ අනුව . හරිතාගාර වායු විමෝචන සත්‍යාපනය කිරීම, ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය යටතේ සිදු කල හැකි පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ප්‍රමාණය ඉහල නැංවීම මෙන්ම පාරිසරික පුහුණු වැඩමුළු ක්‍රියාත්මක කිරීම ප්‍රමුඛත්වයක් ගනී.

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම , රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ එක්ව ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනයක් ඇති කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය සමඟ එක්ව සුවිශේෂී කාර්යභාර්යක් ඉටු කරනු ලබයි .



ආචාර්ය බී.එම්.එස්. බටගොඩ මහතා අධ්‍යක්ෂ - (ක්ෂේත්‍ර විශේෂඥ)



සිරිපාල අමරසිංහ මහතා (සභාපති) අධ්‍යක්ෂ -, මධ්‍යම පරසර අධිකාරිය



අධ්‍යක්ෂ -ඉරේෂා දිල්හානි මහත්මිය ., කළමණාකරන විගණන අංශය, මුදල් අමාත්‍යාංශය

කාර්යය මණ්ඩලය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම සභාපති, ප්‍රධාන විධායක නිලධාරි ,තාක්ෂණික සහ තාක්ෂණික නොවන නිලධාරීගෙන් සමන්විත වේ. තාක්ෂණික කණ්ඩායම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) විසින් ලබා දී ඇති නිපුණතා අවශ්‍යතා (ISO) 14066 සාර්ථකව සපුරා ඇත.

02 හැඳින්වීම

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත අනුව 2008 අප්‍රේල් 09 වන දින සමාගම් අංක පී වී 63781 යටතේ ලියාපදිංචි රජය සතු සමාගමකි. පසුව මෙය පරිසර අමාත්‍යාංශය විෂය පථය යටතේ 2020 සැප්තැම්බර් 25 වන දින අති විශේෂ ගැසට් පත්‍රය මගින් ගැසට් වන ලදි .ආරම්භයේ දී ශ්‍රී ලංකා කාබන් අරමුදල (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් හැඳින්වූ අතර පාරිසරික ව්‍යාපෘතීන් සඳහා දක්වන දායකත්වය හා විෂය පථය පුළුල් කර ගැනීමේ අරමුණින් 2016 ජනවාරි 29 වන දින සිට ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම ලෙස සමාගම් නාමය වෙනස් කරන ලදී.

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල මඟින් රාජ්‍ය හා පෞද්ගලික අංශ සඳහා තිරසාර පාරිසරික ව්‍යාපෘතීන් රැසක් දේශීයව හා විදේශීයව ක්‍රියාත්මක කරනු ලැබේ .සමාගමේ ප්‍රමුඛතම අරමුණ වන්නේ කාබන් විමෝචන සත්‍යාපනය තුළින් අඩු කාබන් ආර්ථිකයක් ගොඩනැගීම සඳහා දායක වීමයි. තවද රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාබන් විමෝචන කාර්යය සාධනය ප්‍රශස්ථ කරලීමට මහපෙන්වීම ද සිදු කරනු ලැබේ.

2.1. දැක්ම

කාබන් උදාසීන හා දේශගුණික ප්‍රත්‍යාස්ථිතික නීල හරිත ආර්ථිකය.

2.2. මෙහෙවර

කාබන් අවම හා දේශගුණික ප්‍රත්‍යාස්ථිතික නීල හරිත සංවර්ධනයක් සඳහා ශ්‍රී ලාංකිකයන්ට සහාය වීම.

2.3. ආයතනික අරමුණු

I. එක්සත් ජාතීන්ගේ දේශගුණ වෙනස්වීම පිළිබඳ රාමුගත සම්මුතිය (UNFCCC) සහ කියෝතෝ සම්මුතියෙහි (Kyoto Protocol* ඇතුළත් පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය (Clean Development Mechanism –CDM) ඇතුළු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.

II. පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණයට අදාළ ව්‍යාපෘති සංවර්ධනය සඳහා පුද්ගලික රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානයන්ට උපදේශන සේවා සැපයීම, පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණට අදාළ ව්‍යාපෘති වලංගුකරණය (Validation) සහ සත්‍යාපනය (Verification) සඳහා පුද්ගලික සහ රාජ්‍ය ආයතනයන්ට පහසුකම් සැපයීම සහ හරිතාගාර වායු විමෝචනය අඩු කරන ව්‍යාපෘති සඳහා මූල්‍ය සම්පත් ලබා දීම.

III. පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය යටතේ සහතික කරන ලද හරිතාගාර වායු විමෝචන අඩු කිරීම (Certified Emission Reduction-CER) සහ ස්වේච්ඡා යාන්ත්‍රණයක් (Voluntary Mechanism) මඟින් සහතික කරන ලද හරිතාගාර වායු විමෝචන අඩු කිරීම් (Verified Emission Reduction) හා කාබන් වෙළෙඳාම.

IV. පාරිසරික තක්සේරුකරණය ඇතුළු පාරිසරික නිෂ්පාදන අලෙවිකරණ වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම.

V. ආයතනික ව්‍යාපෘති සහ නිෂ්පාදන මට්ටමේ හරිතාගාර වායු විමෝචන ප්‍රමාණීකරණය සහ සත්‍යාපනය සඳහා ක්‍රියා කිරීම.

VI. පරිසර තත්ත්ව වැඩි දියුණු කිරීම සඳහා විද්‍යාගාර සේවා සැපයීම.

VII. පාරිසරික සංචාරක කර්මාන්තය ඇතුළු පාරිසරික නිෂ්පාදන අලෙවිකරණ වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම.

VIII. ජෛව අපේක්ෂක වැඩසටහන් (Bio-prospecting programme) සංවර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම.

IX. සනීපාරක්ෂ කසළ බැහැර කිරීම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

X. වාණිජ වශයෙන් ශක්‍ය වෛද්‍ය සහ අන්තරායකර අපද්‍රව්‍ය දහනයන් සංවර්ධනය සහ පවත්වාගෙන යාම.

XI. ව්‍යාපෘති සංවර්ධකයින්ට අවශ්‍ය ඕනෑම සහාය සේවාවන් ලබා දීම.

XII. පාරිසරික නිෂ්පාදන සහ සේවා සංවර්ධකයින්ට සාධාරණ කොන්දේසි යටතේ මූල්‍ය සහාය ලබා දීම.

XIII. පාරිසරික සේවා සහ පරිසර දූෂණය වෙනුවෙන් භාවිත ගාස්තුවක් අය කිරීම සහ ලැබෙන මූල්‍ය ප්‍රතිලාභ ඔස්සේ තෝරා ගත් කර්මාන්තකරුවන්ට සහ ව්‍යාපාර සමූහයන්ට පාරිසරික සේවා සැපයීම.

XIV. හරිත වාර්තාකරණය (Green Reporting) ප්‍රවර්ධනය කිරීම උදෙසා පුද්ගලික සමාගම්වලට සහ නියෝජිතයතනයන්ට සහාය වීම.

XV. තිරසාර සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අරමුදල් ආයෝජනය කිරීම.

XVI. පරිසරයට සම්බන්ධ ඕනෑම ආකාරයේ පාරිසරික ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම.

XVII. ශ්‍රී ලංකාව හරිත ආර්ථිකයක් (Green Economy) කරා පරිවර්තනය කිරීමට අදාළ ඕනෑම කටයුත්තක් ක්‍රියාවට නැංවීම

2.4. ශ්‍රී ලංකා දේශගුණ අරමුදලේ දායකත්වය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගමේ හි අරමුණ වන්නේ අඩු කාබන් ව්‍යාපාරික ආර්ථිකයක් ගොඩ නැගීම සඳහා පහසුකම් සැපයීමයි .එහි උත්සාහයන් තුලින් ඵලදායි, අඩු කාබන් විසඳුම් සඳහා ඇති හැකියාව වැඩි දියුණු කිරීමත්, නව්‍ය උපාය මාර්ග ගවේෂණය කිරීමත් ,පවතින පහසුකම් තුල කාබන් විමෝචනය ප්‍රශස්ථ කිරීම සඳහා මඟ පෙන්වීමත් සිදු කෙරේ .ඒ අනුව කර්මාන්තවල පාරිසරික පියසටහන අවම කරමින් එම ආයතන වල තිරසාර ව්‍යාපාරික භාවිතයන් වැඩි දියුණු කරගැනීමට සහ ව්‍යාපාර වල පාරිසරික ගුණාත්මකභාවය වැඩි දියුණු කරගැනීමට පහසුකම් සපයනු ලබයි.


ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම දේශීය ව්‍යාපාර ආයතන සඳහා ගුණාත්මක සත්‍යාපන සේවා සැපයීමෙන් එම ආයතනවලට ජාත්‍යන්තර වෙළෙඳපොළ වෙත යෑම පහසු වී ඇත .ගෝලීය දේශගුණ ක්‍රියාකාරකම් වලට ශ්‍රී ලංකාවේ දායකත්වය තුලින් එහි විනිවිදභාවය හා වගකීම් සහගත බව පෙන්නුම් කිරීමට ද අවස්ථාව උදාවී ඇත .

ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය මඟින් කාබන් වෙළඳාමට පහසුකම් සැලසීමත්, ව්‍යාපාරවලට කාබන් ඉවත් කිරීමේ ව්‍යාපෘති සඳහා ආයෝජනය කළ හැකිවීමත් සහ එම විමෝචනය පියවා ගැනීමට වේදිකාවක් නිර්මාණය කිරීමත් සිදුකරයි .මෙය පාරිසරික වගකීම ප්‍රවර්ධනය කරනවා පමණක් නොව, තිරසාර අනාගතයකට ද දායකත්වය දක්වනු ලබයි.

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල ජාතික දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සඳහා වූ මඟ පෙන්වන්නෙකු ලෙසද කටයුතු කරනු ලබයි. කර්මාන්තයන් තුලින් සමස්ත ප්‍රජාවට දේශගුණික ක්‍රියාකාරීත්වයේ විවිධත්වය අවම කිරීමේ සිට අනුවර්තනය දක්වා සමාගමෙන් සපයනු ලබන සේවාවන් අතිවිශාලය .පාරිසරික විශිෂ්ටත්වය සඳහා වන ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂා ඉටුකර ගැනීමේ එම සංවිධාන, ව්‍යාපාර සහ ව්‍යාපෘතිවලට සහාය දීම සමාගමේ ප්‍රධාන කාර්යයභාරයක් වේ. එමෙන්ම දේශගුණික අභියෝගවලට එරෙහිව ශ්‍රී ලංකා රජය සහ පුද්ගලික අංශය විසින් ගෙන යනු ලබන වැඩපිළිවෙල සඳහා දී සහය දීමෙන් සුවිශේෂී කාර්යයක් ඉටු කරනු ලබයි.

සමාගම මඟින් ක්‍රියාත්මක වූ ජල විදුලි හා සූර්යය ශක්ති මඟින් විදුලිය නිපද වූ ආයතන ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය යටතේ විගණනය වූ අවස්ථා කිහිපයක් පහත පළමු, දෙවන හා තෙවන රූප රාමුවලින් දැක්වෙන අතර දේශගුණ විපරියාස සම්බන්ධව පවත්වන ලද දේශණයක් හතර වන රූපයෙන් දැක්වේ.


1


2


3


4

03.ආයතනික ගමන්මඟ



සේවාවන්

- හරිතාගාර වායු සත්‍යාපනය (ISO 14064, ISO 14067)
- ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය
- පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය
- ශුද්ධ ශූන්‍ය (Net Zero Energy) බලශක්ති සහතිකකරණය
- දේශගුණික ධනාත්මක සහතිකකරණය (Climate Positive Certification)
- උපදේශන සේවාවන්
- ව්‍යාපෘති හා මූල්‍ය කළමනාකරණ ව්‍යාපෘති

2008

පරිසර අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා කාබන් අරමුදල ස්ථාපිත කිරීම

2010

පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණ ව්‍යාපෘති ආරම්භ කිරීම

2013

ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති ආරම්භ

2013

දේශගුණ කර්මාන්ත හා ව්‍යාපාර සඳහා ස්වේච්ඡා හරිතාගාර වායු වාර්තා කිරීමේ ප්‍රමිතීන් හා අවශ්‍යතා හඳුන්වා දීම.

2016

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල ලෙස ව්‍යාපාර නාමය වෙනස් කිරීම .

2016

ශ්‍රී ලංකා කාබන් ප්‍රමිතියේ ක්‍රියාකාරී යාන්ත්‍රණය ප්‍රතිව්‍යුහගත කිරීම

2016

ශ්‍රී ලංකා ප්‍රතිඥා මණ්ඩලය විසින් ISO නම් 14065 ප්‍රතිඥා සහතිකය ලබා ගැනීම

2018

දේශගුණික විපර්යාස පිළිබඳ තෙවන ජාතික සන්නිවේදනය සඳහා ජාතික හරිතාගාර වායු ගණනය කිරීම සහ ලේඛන ගත කිරීම් සඳහා කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කිරීම

2020

ශුද්ධ ශූන්‍ය බලශක්ති සහතික කිරීමේ හා කාබන් ධනාත්මක කිරීමේ පද්ධතිය හඳුන්වා දීම

04.සේවාවන්

තිරසාර පරිසරයක් ගොඩනැගීම සඳහා සිදු කරනු ලබන ව්‍යාපෘතින් සත්‍යාපනය හා වලංගුකරණය මෙන්ම උපදේශන සේවාවන් ක්‍රියාත්මක කිරීමද සිදු කරනු ලබයි. ඒ අනුව සමාගම මඟින් කරනු ලබන ප්‍රධාන සේවාවන් ලෙස,

1. හරිතාගාර වායු සත්‍යාපනය (ISO 14064 , ISO 14067)
2. ශ්‍රී ලංකා කාබන්ණය යෝජනා ක්‍රමය (SLCCS)
3. පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය (CDM)
4. ශුද්ධ ශූන්‍ය (Net Zero Energy) බලශක්ති සහතිකකරණනය
5. දේශගුණික ධනාත්මක සහතිකකරණය (Climate Positive Certification)
6. උපදේශන සේවාවන්
7. ව්‍යාපෘති හා මුල්‍ය කළමනාකරණ ව්‍යාපෘතින් හඳුන්වාදිය හැකිය.

4.1 හරිතාගාර වායු සත්‍යාපනය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් ISO 14064–1 :2018 හා ISO 14067 :2018 යන අනුකූලතා සහතිකපත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා දේශීයව හා විදේශීයව පිරිනමනු ලබයි. එම ආයතන විසින් ගණනය කරන ලද හරිතාගාර වායු විමෝචනය සත්‍යාපනය කිරීමෙන් අනතුරුව එම සහතිකපත් පිරිනමනු ලබයි .ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ඉහත සඳහන් සත්‍යාපන ක්‍රියාවලිය සඳහා සමාගමට අවසර ලබා දී ඇත .හරිතාගාර වායු විමෝචන ගණනය කිරීම වාර්ෂිකව සිදු කරනු ලබන අතර තෙවන පාර්ෂිය සත්‍යාපනයක් තුලින් එම ආයතනික තොරතුරු සඳහා වටිනාකමක් ලබාදේ .මේ අනුව 2020 වර්ෂය සඳහා හරිතාගාර වායු සත්‍යාපනය අංශයට ව්‍යාපෘති 24 ක ඉලක්කයක් ලබා දී තිබුන ද එම වර්ෂයේ ඇතිවූ ගෝලීය වසංගත තත්වය එකී ඉලක්කයන් කරා යෑමට අවහිරයක් විය .නමුත් මාර්ගගත ක්‍රමය ඔස්සේ සත්‍යාපන කටයුතු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබූ අතර එහි ප්‍රගතිය 2021 වර්ෂයේ දී අත් කරගෙන ඇත .

4.1.1 හරිතාගාර වායු සත්‍යාපන අංශයේ වාර්ෂික ප්‍රගතිය -2020

අනු අංකය	සේවා දායකයාගේ නම	ප්‍රගතිය
හරිතාගාර වායු විමෝචන සත්‍යාපනය - ආයතනික මට්ටම		
01	සිටිසන්ස් ඩිවලප්මන්ට් මුල්‍ය ආයතය	සම්පූර්ණ කර ඇත
02	පීපල්ස් ඉන්ශුවරන්ස් PLC	සම්පූර්ණ කර ඇත
03	තලවකැලේ ටීඑස්ටේට් PLC	සම්පූර්ණ කර ඇත
04	බොගවන්තලාව ටී එස්ටේට් PLC	සම්පූර්ණ කර ඇත
05	කොමර්ෂල් බැංකුව	40% අවසන් කර ඇත
හරිතාගාර වායු විමෝචන සත්‍යාපනය - නිෂ්පාදන මට්ටම		
06	ඇමේසන් ට්‍රේඩින් ප්‍රයිවට් ලිමිටඩ්	80% සම්පූර්ණ කර ඇත

4.2 ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය (SLCCS)

ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය යනු, ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් පරිසර අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස අංශයේ සෘජු අධීක්ෂණය යටතේ පරිපාලනය කරනු ලබන ජාතික හරිතාගාර වායු ව්‍යාපෘති වලංගුකරණය හා සත්‍යාපනය කිරීමේ වැඩසටහනයි. මෙම යෝජනා ක්‍රමය මඟින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සුදුසුකම් ලත් කාබන් කළමණාකරන ව්‍යාපෘති ලියාපදිංචි කරනු ලබන අතර අපේක්ෂිත පාර්ශ්ව සඳහා ගුණාත්මක බව තහවුරු කරන ලද ශ්‍රී ලාංකීය සහතික කරන ලද විමෝචන අඩු කිරීම් :SCER* නිකුත් කරනු ලබයි.

2020 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය යටතේ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති පහක් ලියාපදිංචි කර පැවතුණි. එම වසර තුළ පුද්ගලික අංශය වෙත ව්‍යාපෘති යෝජනා ගණනාවක් ඉදිරිපත් කළ ද, රට තුළ පැවති COVID වසංගත තත්ත්වය හේතුවෙන්, එකී ව්‍යාපෘති ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි කිරීමට නොහැකි විය.

4.3 පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය (CDM)

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් ශ්‍රී ලංකාවේ හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය භාවිතා කිරීමට ආයෝජකයින් දිරි ගැන්වීම හා පහසුකම් සැපයීම සිදු කරනු ලබයි.

එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ :UNFCCC* පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය :CDM* යටතේ ව්‍යාපෘති ලියාපදිංචි කිරීම සහ සහතික කරන ලද විමෝචන අඩු කිරීම් :CER) නිකුත් කිරීම සඳහා වලංගු කිරීම හා සත්‍යාපන ක්‍රියාවලියට පහසුකම් සපයයි. තවද ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් ව්‍යාපෘති සැලසුම් ලේඛනය (PDD) හා අධීක්ෂණ වාර්තාව (MR) සකස් කිරීම සිදුකරනු ලබයි.

4.3.1 පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණ වාර්ෂික ප්‍රගතිය 2020

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප්‍රගතිය
පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය		
01	ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ ජල විදුලි බලාගාර පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය යටතේ ලියාපදිංචි කිරීම	
1.1	කාබන් බැර කිරීමේ කාලය අලුත් කිරීම	සම්පූර්ණ කර ඇත
1.2	සහතික කරන ලද විමෝචන (මුළු ගණන 74147 tCO2e) නිකුත් කිරීම සඳහා අධීක්ෂණය	
1.3	එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය (UNFCCC) වෙත අධීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම, බගවන්තලාව කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය මස්කෙළිය ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය දබල ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය මොරගම ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය ගොමලේ ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය	

4.4 ශුද්ධ ශූන්‍ය (Net Zero Energy) බලශක්ති සහතිකකරණය

ශුද්ධ ශූන්‍ය බලශක්ති සංකල්පය යනු බලශක්තිය භාවිතය මගින් බලශක්තිය සංරක්ෂණ කාර්යක්ෂමතාව සහ ස්ථානීය පුනර්ජනනීය උත්පාදනය 100% සපුරා ගනු ලැබූ බලශක්ති භාවිතයයි. බලශක්ති සහතික කිරීමේ පද්ධතිය, කාබන් විමෝචනය අඩු කිරීම, බලශක්ති කාර්යක්ෂමතා තාක්ෂණය දිරිගැන්වීම හා ආයතනික මට්ටමෙන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් සංවර්ධනය කරන ලද සංකල්පයකි.

පුනර්ජනනීය නොවන බලශක්ති භාවිතය ඉක්මවන පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදන ව්‍යාපෘති ඇති ආයතන **ශුද්ධ ශූන්‍ය** බලශක්ති සහතිකකරණය සඳහා සුදුසුකම් ලබයි. මෙම සහතිකකරණයේ **ප්‍රතිලාභ** ලෙස,

- බලශක්ති භාවිතයෙන් ඇතිවන හරිතාගාර වායු විමෝචනය පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් අඩු කිරීමට හැකිවීම
- ආයතනවලට,අයෝජකයන්ට සහ පාරිභෝගිකයන්ට පරිසර හිතකාමී ව්‍යාපාර වල නිරත වීමට අවස්ථාව ලැබීම
- බලශක්ති පාරිභෝජනය ඉක්මවන පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනය කරන ආයතනවලට ඔවුන්ගේ අතිරික්ත ප්‍රමාණය අලෙවිකර අමතර ආදායමක් උපයාගැනීමට අවස්ථාව ලැබීම
- පුනර්ජනනීය බලශක්ති භාවිතය වැඩිදියුණු කිරීම තුලින් නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීමට හැකි වීම සහ එම ආයතනවලට දිගුකාලීනව තරඟකාරී වෙළඳපල තුල රැඳී සිටීමට අවස්ථාව ලැබීම
- පොසිල ඉන්ධන මත පදනම් වූ බලශක්ති, ඉතාමත් ඉක්මනින් වෙනස්වන මිල සහ සැපයුමක් සහිත වෙළඳපලක් ඇති බලශක්ති මත යැපීම අවම වීම
- රට තුල සංවර්ධනය සඳහා තරඟකාරී පරිසරයක් නිර්මාණය වීම සහ දිගුකාලීන පුනර්ජනනීය බලශක්ති කර්මාන්ත ව්‍යාප්තිය ඉහළ යාම.

4.5 දේශගුණික ධනාත්මක සහතිකකරණය (Climate Positive Certification)

දේශගුණික ධනාත්මක සහතිකකරණය තුලින් ශක්තිමත් ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමටත් ,සැලකිය යුතු විමෝචනය අවම කිරීම තුලින් දිගුකාලීන යහපැවැත්මක් ලඟාකර ගැනීමටත් මඟ පෙන්වයි. නිෂ්පාදන,සේවා හා සංවිධානයන්හි වාර්ෂික හරිතාගාර වායු විමෝචන සහතිකකරණය කිරීම මඟින් ඒවායෙහි හරිතාගාර වායු විමෝචනය පියවා ගැනීමටත් හැකියාව ලැබී ඇත .තවද දේශගුණික ධනාත්මක සහතිකය ලබා ගැනීම සඳහා ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්හි විමෝචනය කෙරෙහි වාර්ෂිකව අවධානය යොමුකිරීම තුලින් ඔවුන්ගේ වාර්ෂික හරිතාගාර විමෝචනය සහ එය සත්‍යාපනය කරමින් අතිරික්ත ප්‍රමාණය අළෙවි කර ගැනීමට ද අවස්ථාව සලසා දී ඇත.

මෙම සහතිකකරණය සඳහා අවශ්‍ය ප්‍රධාන අනුකූලතා

- අපේක්ෂිත ප්‍රමාණාත්මක හරිතාගාර විමෝචන සහතිකය (පිළිගත් තෙවන පාර්ශවයක් විසින් සත්‍යාපනය කරණ ලද)
- අපේක්ෂිත පාර්ශවය විසින් කාබන් කලමනාකරණ ව්‍යාපෘති සංවර්ධනය කිරීම සහ ඔවුන්ගේ විමෝචන අවම කරගත් පිළිගත් ජාතික හා අන්තර්ජාතික විමෝචන ව්‍යාපෘතිගතකරණය
- සහතිකකරණය කරන ලද ව්‍යාපෘති ස්වේච්ඡාවෙන් ක්‍රියාත්මක කල යුතු වීම
- අපේක්ෂිත පාර්ශවය ඔවුන්ගේ හරිතාගාර වායු විමෝචනය අතිරික්ත කාබන් ණය සමඟ හිලව් කිරීම කල යුතුය

දේශගුණික ධනාත්මක සහතිකකරණයට අයත් ක්ෂේත්‍ර

- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය
- නව වනවගා කිරීම හා නැවත වනවගාව
- බලශක්ති කාර්යක්ෂමතාවයන් හා සංරක්ෂණය
- නාස්තිය අවම කිරීම ,නැවත භාවිතයට ගැනීම සහ ප්‍රතිචක්‍රීකරණය

4.6 උපදේශන සේවාවන්

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් කාබන් අවම ආර්ථිකයක් ගොඩනැගීම සඳහා ගනුදෙනුකරුවන්ට තීරණ ගැනීමට අවශ්‍ය මහපෙන්වීම හා නායකත්වය සපයයි. තවද ජාතික හරිත වාර්තාකරණ පද්ධතිය සඳහා ලියාපදිංචි වීමට ද උපදේශන සේවා සපයනු ලබයි.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප්‍රගතිය
ශක්‍යතා අධ්‍යන වාර්තා		
01	වතු සමාගම් මඟින් පවත්වා ගෙන යනු ලබන ඉන්ධන දැව වගාවන් ශ්‍රී ලංකාවේ කාබන් ණය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ශක්‍යතා අධ්‍යනය	40% සම්පූර්ණ කර ඇත

4.7 ව්‍යාපෘති හා මූල්‍ය කළමනාකරණ ව්‍යාපෘති


ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් විවිධ පාරිසරික හා දේශගුණික විපර්යාසය සම්බන්ධ ව්‍යාපෘතීන් හා අරමුදල් කළමණාකරණය සිදු කරනු ලබයි. එකී ව්‍යාපෘතීන් කිහිපයක් වන්නේ,

- ගෝලීය පරිසර පහසුකම් අරමුදලෙන් ක්‍රියාත්මක කරන ලද නූතන ජෛව බලශක්ති තාක්ෂණ ව්‍යාපෘතීන්
- හරිත ලංකා ව්‍යාපෘතිය
- ජාතික අනුහුරුවීමේ සැලසුම
- අපේක්ෂිත ජාතික නිර්ණය කළ දායකත්වය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදලේ විශේෂීකරණ ක්ෂේත්‍ර

- පුනර්ජනනීය බලශක්තීන්
- අනුවර්තනය හෝ අවම කිරීමට (Adaptation and Mitigation) අදාළ උපදෙස් ලබාදීම
- පාරිසරික ඉංජිනේරුකරණය
- MRV පද්ධති වැඩිදියුණු කිරීම
- ප්‍රජා සංවර්ධනය
- සමාජීය අධ්‍යනයන්

05. අපේක්ෂිත මූල්‍ය ඉලක්ක - 2020



06. මූල්‍ය ප්‍රගතිය

2020 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්වය ප්‍රකාශය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම			
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය			
2020 දෙසැම්බර් **31**			
		2020	**2019**
	Notes	රු.	රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	**8**	**-**	9,679
ජංගම වත්කම්			
වෙළඳ හා අනෙකුත් ලැබියයුතු වත්කම්	**9**	**2,845,250**	1,872,353
මුදල් හා මුදල් සමාන වත්කම්	**10**	**10,071,017**	12,860,892
		12,916,268	14,742,924
මුළු වත්කම්		**12,916,268**	14,742,924
හිමිකම් හා වගකීම්			
හිමිකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**11**	**25,000,010**	25,000,010
රදවාගත් ලාභය/ අලාභය		**(13,643,332)**	(12,872,076)
		11,356,678	12,127,934
ජංගම නොවන වගකීම්			
ජංගම වගකීම්			
මූල්‍ය කළමනාකරණ වගකීම්	**12**	**-**	1,193,000
උපචිත ගෙවීම්	**14**	**1,559,590**	1,421,990
		1,559,590	2,614,990
මුළු හිමිකම හා වගකීම්		**12,916,268**	14,742,924

ඉහත සඳහන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර් කොටසක් වන පිටු මත දිස්වන මූල්‍ය ප්‍රකාශන සටහන් සමඟ ඒකාබද්ධව කියවිය යුතුය.

2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව මම සහතික කරමි.

.....	.....	.....
කළමනාකරු - මානව සම්පත් සහ මූල්‍ය	ප්‍රධාන විධායක නිලධාරී	සභාපති

2007 අංක 07 දරන සමාගම් පනතට අනුව මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමක් සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

මණ්ඩලය වෙනුවෙන් සහ ඒ වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.

.....	.....
අධ්‍යක්ෂ	අධ්‍යක්ෂක

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුල විස්තීර්ණ අදායම් ප්‍රකාශය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2020 දෙසැම්බර් 31

	Notes	2020 Rs	2019 Rs
ආදායම	1	**4,172,827.00**	14,703,949.00
ව්‍යාපෘතින්ට අදාළ සෘජු වියදම්	2	**(310,222.22)**	(2,666,897.00)
දළ ලාභය		**3,862,604.78**	12,037,052.00
අනෙකුත් ආදායම්	3	**864,863.64**	973,750.00
		4,727,468.42	13,010,802.00
අඩු කිරීම			
පෞද්ගලික පිරිවැය	4	**4,779,063.16**	4,758,045.00
පරිපාලන වියදම්	5	**550,420.97**	1,273,354.00
විකිණුම් හා බෙදාහැරීමේ වියදම්	6	**4,160.49**	31,582.00
මූල්‍ය හා අනෙකුත් වියදම්	7	**165,080.00**	231,854.00
		5,498,724.62	6,294,835.00
ලාභය(අලාභය)බදු පෙර		**(771,256.20)**	6,715,967.00
බදු		**-**	-
ලාභය(අලාභය)බදු පසු		**(771,256.20)**	6,715,967.00
අනෙකුත් විස්තීර්ණ ආදායම		**-**	-
මුළු විස්තීර්ණ ආදායම		**(771,256.20)**	6,715,967.00

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම			
මුදල් ප්‍රවාහ ප්‍රකාශය			
2020 දෙසැම්බර් 31			
	2020		**2019**
	රු		රු
මුදල් ප්‍රවාහ ප්‍රකාශය - මෙහෙයුම් ක්‍රියාකාරකම්			
බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය / අලාභය	**(771,256.20)**		6,715,967.00
ගැලපුම්			
ක්ෂය වීම්	**9,679.04**		22,623.00
පෙර වසර ගැලපුම්	**-**		269,840.00
	(761,577.16)		7,008,430.00
කාරක පුග්ධනයේ වෙනස්කම්			
වැඩි කිරීම/ (අඩු කිරීම) සහ අනෙකුත් ලැබිය යුතු මුදල්	**(972,897.40)**		(1,092,902.00)
(වැඩිවීම) / අඩුවීම අරමුදල් කළමනාකරණ වගකීම්	**(1,193,000.00)**		(5,502,987.00)
(වැඩිවීම) / අඩු කිරීම අනෙකුත් ගෙවිය යුතු දෑ	**137,599.67**		466,250.00
	(2,028,297.73)		(6,129,639.00)
ශුද්ධ මුදල් ප්‍රවාහය - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්	**(2,789,874.89)**		878,792.00
මුදල් ප්‍රවාහ ප්‍රකාශය - ආයෝජන ක්‍රියාකාරකම්			
ස්ථාවර වත්කම් මිලදී ගැනීම	**-**		(6,638.00)
ශුද්ධ මුදල් ප්‍රවාහය - ආයෝජන ක්‍රියාකාරකම්			(6,638.00)
වැඩි කිරීම/ (අඩු කිරීම) මුදල් හා මුදල් සමාන දෑ	**(2,789,874.89)**		872,154.00
වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ	**12,860,892.00**		11,988,738.00
වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ	**10,071,017.11**		12,860,892.00

2020 දෙසැම්බර් මස 31 මූල්‍ය ප්‍රකාශන සඳහා සවිස්තරාත්මක සටහන

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම					
මූල්‍ය ප්‍රකාශන සඳහා සවිස්තරාත්මක සටහන් - 2020 දෙසැම්බර් 31					
			2020		**2019**
සටහන්			රු.		රු.
1	**ආදායම**				
	හරිතාගාර වායු සත්‍යාපන ආදායම		2,283,157.00		4,554,682.00
	උපදේශන සේවා ආදායම		533,000.00		3,000,000.00
	කාබන් උදාසීන ව්‍යාපෘති ආදායම		200,000.00		100,000.00
	ශුද්ධ ශූනය සහතිකපත් ව්‍යාපෘති ආදායම		-		30,000.00
	පුහුණු හා වැඩමුළු ආදායම		-		-
	ව්‍යාපෘති කළමනාකරණ ආදායම		941,000.00		5,969,266.78
	ශ්‍රී ලංකා කාබන් අරුය යෝජනා ක්‍රමය ව්‍යාපෘතියෙහි ආදායම		215,670.00		1,050,000.00
			4,172,827.00		14,703,948.78
2	**ව්‍යාපෘති සඳහා සෘජු වියදම්**				
	හරිතාගාර වායු සත්‍යාපන වියදම්		92,222.00		484,966.56
	උපදේශන සඳහා වූ වියදම්		68,000.00		1,583,722.50
	පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය සඳහා වූ වියදම				
	පුහුණු හා වැඩමුළු සඳහා වූ වියදම්				
	ව්‍යාපෘති කළමනාකරණ වියදම්				
	SLCF වෙනත් වියදම්				4,645.00
	ශ්‍රී ලංකා ප්‍රතිනත මණ්ඩලය සඳහා වූ වියදම්		150,000.00		564,657.52
	ශ්‍රී ලංකා කාබන් අරුය යෝජනා ක්‍රමය ව්‍යාපෘතීන්හි වියදම				28,905.00
			310,222.00		2,666,896.58
3	**වෙනත් ආදායම්**		864,864.00		973,749.99
	පොලි ආදායම්		864,864.00		973,749.99
4	**පුද්ගල පිරිවැය**				
	සේවක වැටුප්		4,060,400.00		4,114,173.99
	සේවක අර්ථ සාධක අරමුදල		434,400.00		37,800.00
	වැටුප් දීමනා		134,349.00		119,766.30
	පාරිතෝෂික වියදම්		-		-
	සේවක භාරකාර අරමුදල		108,600.00		-
	දුරකථන හා අන්තර්ජාල වියදම		-		-
	සේවක සුභ සාධන		21,714.00		56,373.48
	සේවක පුහුණු වියදම්		-		35,654.94
	ඉන්ධන වියදම්		-		
			4,759,463.00		4,758,045.00

5	**පරිපාලන පිරිවැය**				
	ලේකම් ගාස්තු		58,971.00		110,075.75
	විගණන ගාස්තු		-		37,500.00
	වන්දි මුදල්		-		200,000.00
	වාහන අලුත්වැඩියා හා නඩත්තු වියදම්		223,545.00		387,653.89
	නඩත්තු වියදම්		-		5,250.00
	දුරකථන ගාස්තු		147,904.00		173,369.54
	පරිසනක නඩත්තු වියදම්		19,960.00		27,500.00
	මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය වියදම්		850.00		96,380.00
	රක්ෂණ ගාස්තු - මෝටර් රථය		56,880.00		55,527.83
	ක්ෂය වීම්		9,679.00		22,623.33
	නීතිමය ගාස්තු		-		
	රක්ෂණ ගාස්තු - මෝටර් බයිසිකලය		-		
	වෙබ් අඩවිය සඳහා වූ වියදම්		20,150.00		10,950.00
	තැපැල් හා මුද්දර ගාස්තු		-		5,000.00
	ගමන් වියදම්		2,083.00		5,714.97
	කමිටු සඳහා වූ වියදම්		30,000.00		105,809.00
			570,022.00		1,243,354.31
6	**විකුණුම් හා බෙදාහැරීමේ වියදම්**				
	ප්‍රචාරණ වියදම්		4,160.00		30,532.00
	විකුණුම් ප්‍රවර්ධන වියදම්		-		1,050.00
			4,160.00		31,582.00
7	**මූල්‍ය හා වෙනත් වියදම්**				
	සේවක භාරකාර අරමුදල අධිභාර		1,890.00		779.92
	බැංකු ගාස්තු		3,615.00		3,525.00
	වෙනත් වියදම්		159,575.00		257,549.34
			165,080.00		261,854.26


ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා සවිස්තරාත්මක සටහන්

2020 දෙසැම්බර් 31

සටහන්											
8	දේපල පිරියත උපකරණ										
	වත්කම්										
		වායු සම්කරණ යන්ත්‍ර	අලවන මැෂින්/ බයින්ඩින් මැෂින්	පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	ලී උපකරණ හා උපාංග	මෝටර් රථය	කාර්යාල උපකරණ	මෝටර් බයිසිකලය	නිර රෙදි	මුළු වත්කම්	
		රු.	ශත. රු.	රු.	ශත. රු.	ශත	රු.	ශත. රු.	ශත. රු.	ශත	රු. ශත.
	පිරිවැය										
	2021.01.01 දිනට ශේෂය	209,000.00	7,000.00	1,223,800.00	525,635.38	3,100,000.00	55,000.00	199,640.00	46,410.00		**5,366,485.00**
	එකතු කිරීම්			-							**-**
	2021.01.31 දිනට ශේෂය	209,000.00	7,000.00	1,348,800.00	525,635.00	3,100,000.00	55,000.00	199,640.00	46,410.00		**5,366,485.00**
	සමුච්චිත ක්ෂයවීම්										
	2021.01.01 දිනට ශේෂය	209,000.00	7,000.00	1,223,800.00	525,635.38	3,100,000.00	45,320.96	199,640.00	46,410.00		**5,356,806.34**
	වාර්ෂික ක්ෂය			-			9,679.04				**27,344.00**
	2021.01.31 දිනට ශේෂය	209,000.00	7,000.00	1,251,144.00	525,635.00	3,100,000.00	55,000.00	199,640.00	46,410.00		**5,366,485.38**
	2021.12.31 දිනට ඉදිරියට ගෙන ආ ශේෂය	-	-	-	-	-	9,679.04	-	-		**9,679.04**

විගණන වාර්තාවන්



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. FWL/B/ME/SLCF/02/20/29
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2022 නොවැම්බර් 18 දින

සභාපති,
ශ්‍රී ලංකා දේශගුණික අරමුදල් සුද්ගලික සමාගම.

ශ්‍රී ලංකා දේශගුණික අරමුදල් සුද්ගලික සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නීයාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාරූඪනය කළ මතය

ශ්‍රී ලංකා දේශගුණික අරමුදල් සුද්ගලික සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ඉිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාරූඪනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ නත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

පිටුව 1 | 8

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 www.naod.gov.lk

Scanned with CamScanner

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2020 වර්ෂය සඳහා විගණන ගාස්තු විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ දක්වා නොතිබුණද, ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස රු.150,000 ක් ජංගම නොවන වගකීමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ දක්වා තිබුණි.

(ආ) 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු. 2,662,479 ක් වුවද, ලැබිය යුතු ශේෂ කාල විශ්ලේෂණයට අනුව ශේෂය රු.2,593,632 ක් විය. ඒ අනුව රු.68,847 ක වෙනසක් නිරීක්ෂණය වුවද ඊට හේතු විගණනයට ඉදිරිපත් නොවිය.

(ඇ) ජංගම නොවන වත්කම් තුළ ඇතුළත් රු.5,311,485 ක් වටිනා දේපළ, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වී තිබුණද, එම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර අවශ්‍ය ගැලපීම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත අංක 17 හි 3.1 (b), (c), (d) ඡේදය අනුව, වාහන සම්බන්ධ ක්ෂය ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) සමාගමේ ආදායම ලෙස රු.4,172,827 ක් දක්වා තිබූ අතර එහි එක් එක් ආදායම් අයිතමවලට අදාලව විගණනය වෙත ඉදිරිපත් කරන ලද විස්තරාත්මක ලේඛනය පරීක්ෂා කිරීමේදී අදාල අයිතමවල අගයන් හා මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වෙන අගයන් අතර රු.1,965,047ක වෙනසක් නිරීක්ෂණය වුවද, අදාල වෙනසට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඊ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත අංක 28. 3 (a) අනුව සමාගම විසින් සේවක පාරිතෝෂික සඳහා වෙන් කිරීමක් සිදු කර නොතිබුණි.

(උ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ගිණුම් ප්‍රමිති අංක 4.4 වගන්තිය අනුව රු.10,000,000 ක ස්ථාවර තැන්පතුව ජංගම නොවන වත්කම් ලෙස දැක්විය යුතු වුවද, ජංගම වත්කම් වල මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා තිබුණි.

(ඌ) 2019 දෙසැම්බර් 31 දිනට පිලියෙල කර තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල ජංගම වගකීම් යටතේ පෙන්නුම් කර තිබූ වෙනත් ගෙවිය යුතු දෑ ශේෂය 2020 ජනවාරි 01 දින ඉදිරියට ගෙන ඒමේදී රු.394,276 ක් ලෙස සටහන් කර තිබුණි.

(ඌ) 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඊට අදාල සටහන් නිසි පරිදි විගණනය වෙත ඉදිරිපත් නොවුණි. විගණනය වෙත ලබාදී තිබූ පිටු අංක 09 හා සටහන් අංක රහිතව ඉදිරිපත් කර තිබූ සටහනක සඳහන්ව තිබූ වටිනාකම් අනෙකුත් සටහන් සමඟ නොසැසඳෙන අතර වැටුප් හා දීමනා ලෙස රු.4,194,749 ක් දක්වා තිබූ අතර නැවත පුද්ගල පිරිවැය ලෙස රු.4,779,063 ක් දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සටහන් නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

පිටුව 3 | 8

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණයන්ට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 හි දරන චක්‍රලේඛය	
(i) මාර්ගෝපදේශ අංක 3.1(i) වගන්තිය	2022 සැප්තැම්බර් 08 දින වන විටත් සමාගමේ බඳවාගැනීමේ පටිපාටිය හෝ කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ii) මාර්ගෝපදේශ අංක 4.2 වගන්තිය	2019 ජනවාරි 12 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01-2019 භාවිතා කර විගණන හා කළමනාකරණ කමිටුවද සංයුතිය සකස් කර තිබුණු අතර විගණන හා කළමණාකරන කමිටු පත්කිරීමේ ලිපිය ප්‍රකාරව කමිටු සාමාජිකයන්, නිරීක්ෂකයන් හා කමිටු කැඳවුම්කරු පැහැදිලි ලෙස දක්වා නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 **අනෙකුත් කරුණු**

(අ) 2007 මැයි 24 දිනැති අංක 14/2007 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3(1)(ආ) ඡේදයට අනුව, අරමුදල ස්ථාපිත කිරීමේ කාර්යපටිපාටි කෙටුම්පත් කර අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා කාබන් අරමුදල් පුද්ගලික සමාගම නමින් රුපියල් මිලියන 25 ක මුදලක් සාමාන්‍ය කොටස් නිකුතු ප්‍රාග්ධනයක් ලෙස 2011 දෙසැම්බර් 31 වන දින මහා භාණ්ඩාගාර ලේකම් නමින් කොටස් සහතිකයක් නිකුත් කර තිබුණි. 2015 ජනවාරි 16 දින සමාගමේ නම ශ්‍රී ලංකා දේශගුණික අරමුදල පුද්ගලික සමාගම ලෙස වෙනස් කර තිබුණද කොටස් සහතිකය ශ්‍රී ලංකා කාබන් අරමුදල පුද්ගලික සමාගම නමින් පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) ලංකා බැංකු ගිණුමට අදාලව 2019 වර්ෂයේ සිට පවතින රු.362,036 ක් වටිනා නිකුත් කළ නමුත් නිශ්කාෂණය නොවූ චෙක්පත් වලට අදාල අගය ආදායමට බැර කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ඇමතුම් විස්තර

ලිපිනය : පරිසර අමාත්‍යාංශය, නො. 416/සී/1, "සොබාදම් පියස, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල.

දුරකථන : 011 205 3065

විද්‍යුත් තැපෑල : info@climatefund.lk

වෙබ් අඩවිය : www.climatefund.lk